මලල ක්‍රීඩා පිටියටත් දිරිගන්වන්නෙක්

කසුන් සේනාරත්න

තරගයකදී ජයග්‍රහණය හිමිවන්නේ එකී තරගයට සහභාගි වී සිටින කණ්ඩායමක්, එසේත් නැත්නම් ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩිකාවක ඒ අවස්ථාවේදී දක්වන දස්කම් මත බව සැබෑවකි. එසේ වුවත් කෙනෙකුගේ හෝ කණ්ඩායමක උපරිම දක්ෂතා මතුවීම කෙරෙහි තරග නරඹන දිරිගන්වන්න ගෙන් ලැබෙන සහයද බලපෑමක් කරන බව සැබෑවකි.

කණ්ඩායම් තරගයකදී නොව දිරිගන්වන්නන්ගේ සහය වැඩි වශයෙන් බලපෑමක් කරනු ලබන්නේ ඒක පුද්ගල තරගවලදී යයි පැවසීම සත්‍යයකි. දිරිගැන්වීමේදී දිරිගන්වන්නන්ගේ සහය ලබන ක්‍රීඩකයාගේ හෝ ක්‍රීඩිකාවගේ මානසික ශක්තිය ඉහළ යන අතරම ප්‍රතිවාදියාගේ මානසික තත්ත්වයේ පසුබෑමක් ද ඇතිවීම සාමාන්‍ය තත්වයකි. මේ නිසා විශේෂයෙන්ම ඒක පුද්ගල තරගවලදී දිරිගැන්වීමේ කලාවේද දැන් දැන් තරගකාරී බවක් දක්නට ඇත.

පර්සි අබේසේකර ජාතික කොඩියද රැගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම තරග වදින එතෙර මෙතෙර සෑම තරගයකදීම ඔවුන් දිරිගන්වමින් ක්‍රීඩාංගණය පුරා සැරිසැරීම දැන් බොහෝ දෙනෙකුට හුරු පුරුදු දර්ශණයකි. ක්‍රිකට් කණ්ඩායම් ක්‍රීඩාවකි. එම නිසා ශ්‍රී ලංකා කණ්ඩායම තනි පුද්ගලයෙකු ලෙස හෝ දිරිගැන්වීමට ඉදිරිපත්වීම සම්බන්ධයෙන් පර්සි අබේ-සේ කර මහතාට අපගේ ගෞරවය හිමිවිය යුතුය.

මේ අතර පසුගියදා කොළඹ සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේදී 10 වැනි දකුණු ආසියානු ක්‍රීඩා උළෙලට අයත් මලල ක්‍රීඩා තරග පැවැත්වෙද්දී ක්‍රීඩා පිටියට දිරිගන්වන්නෙකු සම්ප්‍රාප්ත වනු දැක ගත හැකි විය. ඔහු අප දන්නේ ජයලත් යනුවෙනි. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සුළු සේවකයෙකු වුවත් ජයලත්ට මලල ක්‍රීඩා සංගමයේ නිලතල දරණ පැරණි ක්‍රීඩකයින්ට වඩා නම් ක්‍රීඩකයින් ගැන කැක්කුමක් තිබුණු බව පැහැදිලිව දැක ගත හැකි විය.

කාන්තා කවපෙත්ත විසිකිරීමේ ඉසව්වේ රන්පදක්කම පද්මා නන්දනී නම් ක්‍රීඩිකාව ශ්‍රී ලංකාවට අත්කර දුන් බවක් ඒ මොහොතේ ක්‍රීඩාංගණයට රැස්ව සිටි බො-හෝ දෙනෙකු දැන සිටියේ නැත. සමහර විට එම අවස්ථාවේ තවත් මලල ක්‍රීඩා ඉසව් කිහිපයක්ම පැවැත්වෙමින් තිබීමද පද්මා නන්දනීගේ රන්පදක්කම වැඩි අවධානයකට ලක් නොවීමට හේතුවූවා විය හැකිය.
තවද පද්මා නන්දනී ලබා ගත් ජයග්‍රහණය ඒ මොහොතේ ශබ්දවාහිනී යන්ත්‍ර ඔස්සේ ප්‍රකාශයටද පත් නොකළේය.
ශ්‍රී ලංකාව වෙනුවෙන් රන්පද-ක්කම් දිනා ගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාතික කොඩි සපයමින් ක්‍රීඩාංගණය වටා සැරිසැරූ ජයලත් පවා පද්මා නන්දනීගේ ජයග්‍රහණය දැන නොසිටියේය. මේ නිසා ඇය ජයග්‍රහණ අත් කරගත් මො-හොතේ ඇයට ජාතික ධජය සැපයීමට නොහැකිවීම සම්බන්ධයෙන් ජයලත් තුළ අදටත් ඇත්තේ බලවත් සංතාපයකි. එය ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිළිබඳ මලල ක්‍රීඩා පරිපාලනය නොදක්වන තරමේ ලෙන්ගතු හැඟීමකි.
ජයලත් සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේදී ප්‍රදර්ශණය කළ සත් ක්‍රියාව මලල ක්‍රීඩා නීතිරීතිවලට අනුව කෙතරම් දුරට ගැලපේදැයි අපි නොදන්නෙමු. නමුත් මලල ක්‍රීඩා සංගමයේ නිලධාරීන්ට වඩා විශාල සංයෝගයක් යැයි පැවසීමේ වරදක් නැත.

මසුම් රාහිම
පදක්කම් දායක අභිමානය

සිමොන් වැන්නිර් මීටර් 100 ඉසව්ව වෙනුවෙන්ද රමණි මංගලිකා මීටර් 200 ඉසව්ව වෙනුවෙන් ද 1984 වසරේ නේපාලයේ කත්මන්ඩු නගරයේ පැවැති පළමුවන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේදී රන්පදක්කම් දිනා ගනිමින් ශ්‍රී ලංකාව රනින් සැරසූ පළමු ක්‍රීඩිකාවන් ලෙස උළෙල ඉතිහාස-යට එක්වුහ.
එතැන් සිට 1991 වසරේ ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ පස්වැනි දකුණු ආසියානු ක්‍රීඩා උළෙල තෙක්ම මලල ක්‍රීඩා ඉසව් ඔස්සේ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් රන් පදක්කම් දිනා ගත්තේ මද වශයෙනි.
ඒ අනුව 1985 වසරේ ඩකා හිදි කාන්තා දුර පැනීම ඉසව්වේදී මීටර් 5.73 ක පිම්මක් සහිතව දිලීමා පීටර්සන්ද, 1987 වසරේ කල්කටා හිදි කාන්තා මීටර් 100 කඩුලු ඉසව්ව තත්පර 14.48 කින් නිම කල නිලකා පිනදාස විසින්ද 1989 වසරේ ඉස්ලාමාබාද් නගරයේදී මීටර් 53.06 ක දුරක් හෙල්ල විසිකල විජිතා අමරසේකර විසින්ද ශ්‍රී ලංකාවට එක එක රන් පදක්කම බැගින් තිළිණ කර තිබුණි.
කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ පැවති 5 වැනි ක්‍රීඩා උළෙලේදී රන් පදක්කම් සටහනේ පෙරමුණ ගත් ශ්‍රී ලාංකික ක්‍රීඩිකාවන් ඉන්දීය ක්‍රීඩිකාවන්ද අභිබවා යමින් පදක්කම් 9ක් දිනා ගත්තේය. ඉන්දීය ක්‍රීඩිකාවන්ට රන් පදක්කම් 6 ක් පමණක් ඉතිරි කරමිනි. එම මෙහෙයුමේදී ශ්‍රී ලංකාවට නායකත්වය දුන් දම්මිකා මැණිකේ මීටර් 800 හා මීටර් 1500 යන ඉසව් වෙනුවෙන්ද ශ්‍රියානි කුලවංශ උස පැනීම හා මීටර් 100 කඩුලු යන ඉසව් වෙනුවෙන් ද රන් පදක්කම් දෙක බැගින් පිළිගන්වනු ලැබීය.
ශ්‍රියානි කුලවංශ 1991 වසරේ කාන්තා උස පැනීමේ ඉසව්ව ජයග්‍රහණය කරන්නට මීටර් 1.75 ක උසක් තරණය කර තිබුණි. නමුත් ඉන් අනතුරුව ඇය උස පැනීමේ ඉසව්ව අතහැර දමනු ලැබූ බැවින් එතැන් සිට එම රන් පදක්කම වැඩි වාර ගණනකදී ඉන්දීය බුදලයක් බවට පත්විණි.
විශේෂයෙන්ම දකුණු ආසියානු ක්‍රීඩා උළෙල ඉතිහාසයේ දෙවරක්ම කාන්තා උස පැනීමේ ඉසව්වේ රන් පදක්කම් දිනා ගන්නට ඉන්දියාවේ බාවි ඇලෝසියස්ට අවස්ථාව ලැබුනේද ශ්‍රියානිගේ සමුගැනීම නිසා යයි පැවසීම වරදක් විය නොහැකි ය.

වසර 15 කට පසු පිනු

දුලාංජලීගේ රන් පිම්ම

අවධානයකින් යුතුව ශ්‍රී ලංකාව වෙනුවෙන් රන් පදක්කම් දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාතික ධජය සැපයීමේ කාර්යය ඔහු අපූරුවට ඉටුකල බව අපගේ පිළිගැනීමය.

ක්‍රිකට් ක්‍රීඩාවට දැඩිව ආදරය කරන පර්සි වැනි දිරි ගන්වන්නෙකු මලල ක්‍රීඩාවටද ලැබී ඇතැයි ජයලත් පිළිබඳ අපට සතුටු විය හැකිය. මේ නිසා ක්‍රිකට් හා පර්සි මෙන් මලල ක්‍රීඩාව හා ජයලත්ද අපූරු

ඒ අනුව ශ්‍රියානි කුලවංශ 1991 වසරේ ශ්‍රී ලංකාවට ශ්‍රී ලංකාවේදී හිමිකර දුන් දකුණු ආසියානු කාන්තා උස පැනීමේ රන් පදක්කම වසර 15 ක් ඇවෑමෙන් යළිත් ශ්‍රී ලංකාවේදීම ශ්‍රී ලංකාවට හිමිකර දෙන්නට 17 හැවිරිදි වියේ පසුවන කොළඹ දේවි බාලිකා විද්‍යාලේ සිසුවියක වන දුලාංජලි රණසිංහ සමත් වූවාය. අදගේ රන් පිම්ම මීටර් 1.71 ක් ලෙස සටහන්ව තිබුණි. එය තරග වාර්තාව අභිබවා යන්නට සෙන්ටි මීටර් 10 ක අඩුවක් වූවද දුලාංජලි එදා පැළඳි එම රන් පදක්කමේ සුන්දරත්වය අඩුවීමට එය හේතුවක් වූයේ නැත. නමුත් මුළු රටටම එම රන් පදක්කමේ සුන්දරත්වය දකින්නට අවස්ථාව ලැබී තිබුණද ඒ වනවිට එම අගනා රන් පදක්කමේ නිර්මාණකරුවා කව්රුන්ද යන්න නම් දැන සිටි පිරිස ඉතා අල්ප බව සඳහන් කළ යුතුමය.

එක්තරා දිනක එවකට පුත්තලම ශාන්ත ඇන්ඩෘ විද්‍යාලේ ඉගෙනුම ලැබූ දුලාංජලි උස පනින අයුරු දිලීමා පීටර්සන් නම් පැරණි ක්‍රීඩිකාවගේ නෙත ගැටීම මෙම රන් පදක්කමේ කථා පුවතට පාදක වී ඇත.
දෙවන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ මලල ක්‍රීඩා තරගවලදී ශ්‍රී ලංකාවට හිමි වූ එකම කාන්තා රන් පදක්කමේ හිමිකාරිය වෙමින් මීටර් 5.73 දුරක් තරණය කර ඇති දිලීමා පීටර්සන් කොළඹ දේවි බාලිකා විද්‍යාලේ වත්මන් මලල ක්‍රීඩා පුහුණුකාරිය ලෙස සේවය කරන්නීය. මලල ක්‍රීඩාව සමග ජීවිතයේ වැඩි කාලයක් තවමත් ගත කරණ දිලීමා එදා දුලාංජලිගේ ඉරියව් සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කර තිබුණි. මතු දිනක ශ්‍රී ලංකාවට උස පැනීමේ ඉසව්වෙන් රන් පදක්කමක් හිමිකර දෙන්නට දුලාංජලි රණසිංහට හැකි වන බව පැහැදිලිව දුටු දිලීමා අය දේවි බාලිකා විද්‍යාලට කැඳවා ගෙන එන්නට මූලිකත්වය ගෙන තිබුණි.
පසුගිය වසර හතරක කාලයක් තිස්සේම දිලීමා පීටර්සන් යටතේ පුහුණුව ලැබීමේ අවස්ථාව දුලාංජලිට හිමිවූයේ ඒ අයුරිනි. ඒ කාලය තුළ මෙම රන් පදක්කම වෙත ලඟා විය හැකි ගමන් මාර්ගය දුලාංජලි රණසිංහ දිලීමා පීටර්සන්ගෙන් නිවැරදිව ලබා ගත්තාය.
අවසන් වශයෙන් දුලාංජලිගේ මෙම ජයග්‍රහණය පිළිබඳ අපට සටහන් තැබිය හැක්කේ එය දකුණු ආසියානු ක්‍රීඩා උළෙල ඉතිහා-සයේ රන්පදක්කම් ලාභිනියක විසින් තවත් රන් පදක්කම් ලාභිනියක ඛිහිකළ එකම හා පළමු අවස්ථාව වශයෙනි.

ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයේ වාර්ෂික සම්මාන උළෙල ඔක්තෝබර් 23 දා

ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයේ වාර්ෂික ක්‍රිකට් සම්මාන උළෙලේ ප්‍රධාන සම්මාන 4 ක් සඳහා ඉන්දියාවේ රාහුල් ද්‍රාවිඩ්, ශ්‍රී ලංකාවේ මහේල ජයවර්ධන හා ඔස්ට්‍රේලියාවේ රිකී පොන්ටින්ගේ නම් යෝජනා කර තිබේ.

සම්මාන සඳහා යෝජනා කර ඇති නාම ලේඛනයේ ප්‍රධාන සම්මාන 3 ක් සඳහා ශ්‍රී ලංකාවේ මුත්තයියා මුරලිදරන්ද සිටින අතර කුමාර් සංගක්කාර ප්‍රධාන සම්මාන 2 ක් සඳහා නම් කර තිබේ.

වසරේ නැගී එන ක්‍රිකට් ක්‍රීඩකයා සම්මානය සඳහා ශ්‍රී ලංකාවේ මාලිංග බණ්ඩාර හා උපුල් තරංගගේ නම් යෝජනා කර තිබේ. වසරේ විශිෂ්ඨතම නායකයා සඳහා ද්‍රාවිඩ්, පොන්ටින්, මහේල සහ මයිකල් වෝන් අතර සටනක් ඇතිවී තිබේ.

මෙම සම්මාන සඳහා නම් යෝජනා කර ඇත්තේ පසුගිය 2005 අගෝස්තු 1 දා සිට 2006 අගෝස්තු 1 දා දක්වා දක්වන ලද දස්කම් මතවේ. සම්මාන උළෙල ලබන ඔක්තෝබර් 23 දා මුම්බායිහිදී පැවැත්වේ.